**ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය - 2024**

**-----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ (විශ්වවිද්‍යාලය) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරුවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,

- විශ්වවිද්‍යාලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සහ

- විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වසර 5 ඉක්මවූ විවිධ ණයගැති වටිනාකම රු.11,511,674 ක් විය. කෙසේ වෙතත් ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍රමිත අංක 10 හි 21 ඡේදය ප්‍රකාරව හානිකරණය සඳහා වෙන් කිරීමක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් ආධාරක ලියකියවිලි සහ තහවුරු කිරීම් නොමැතිකම හේතුවෙන්, ඉහත සඳහන් ශේෂයන්හි අයකර ගැනීමේ හැකියාව සත්‍යාපනය කිරීමට අපට නොහැකි විය. අයකර ගැනීමේ කිසිදු ප්‍රගතියක් නොමැතිව ශේෂයන් වසර දහයකට වැඩි කාලයක් අඛණ්ඩව පවතී. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල විය යුතුය. |
| (ආ) රු. 26,272,214 ක් වූ ආයෝජන පොලී ආදායම, සමාලෝචිත වර්ෂයට අදාල ආදායමක් ලෙස හඳුනා ගැනීම වෙනුවට අරමුදල් ගිණුමට බැර කර තිබුණි. | සීමිත අරමුදල් වෙත මාරු කිරීමට පෙර, ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍රමිත අංක 10 ප්‍රකාරව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ආයෝජන ආදායම නිසි ලෙස හඳුනා ගැනීම සඳහා වර්තමාන මූල්‍ය වර්ෂය තුළ දැනටමත් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත. | -එම- |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විශ්වවිද්‍යාලයේ බැංකු සැසඳුම් ප්‍රකාශනවල, පිළිවෙලින් රු.3,925,059 ක් සහ රු.1,604,146 ක් වූ ඍජු හර සහ තැන්පතු, හඳුනා නොගත් හර සහ හඳුනා නොගත් තැන්පතු ලෙස වසර 14 කට වැඩි කාලයක් දක්වා තිබුණි. | 2009 ට පෙර ලියකියවිලි සොයා ගැනීමට කවුන්සිලයට නොහැකි වී ඇති අතර එම කාලයේ සිට ඇති වූ ගැටළු විසඳීමට පියවර ගෙන ඇත. කවුන්සිලය විසින් තීරණය කළ පරිදි අවශ්‍ය කපා හැරීම් සිදු කර ඇත. | කපා හැරීමට පෙර අදාල හර හා තැන්පතු හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවල වැඩිවීම රු.181,407,693 කි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව, කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස රු.537,256,699 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගලා ඒමක් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරනු ලැබේ. | ගිණුම්වල ගැලපීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 අවිධිමත් තක්සේරු කිරීම් හෝ ඇස්තමේන්තු කිරීම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්වවිද්‍යාලයේ ස්ථාන 15 ක හෙක්ටයාර 241.2 ක මුළු ඉඩම් මූල්‍ය ප්‍රකාශනවලට තක්සේරු කර හඳුනාගෙන නොතිබුණි. | අදාළ ඉඩම්වල නීත්‍යානුකූල හිමිකාරිත්වය ලබා ගැනීම සඳහා දැනට කටයුතු කරමින් පවතී. හිමිකාරිත්වය පවරා ගැනීමෙන් පසු ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කඩිනමින් සහ ඉක්මනින් පියවර ගනු ලැබේ. | තක්සේරු කර ගිණුම්වලට ගෙන ඒමට පියවර ගත යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 571 | රු.16,264,477 ක රඳවා ගැනීමේ ශේෂයන් සහ රු.850,000 ක ආරක්ෂක තැන්පතු වසර තුන සිට අට දක්වා කාලයක් පුරා පියවීමට හෝ ආදායමක් ලෙස හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ක්‍රියා පටිපාටියට අනුකූලව සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | මුදල් රෙගුලාසිවලට අනුව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) අංක 03/2022 හා 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව, නව මණ්ඩපයක් ඉදිකිරීම සහ පැරණි මණ්ඩපයේ ප්‍රතිසංස්කරණය සහ දීර්ඝ කිරීම සඳහා අතිරේක වැඩ ඇතුළුව විශ්වවිද්‍යාලය විසින් රු.48,598,255 ක් (වැට් බද්ද ඇතුළුව) වැය කර තිබුණි. | එම වසරේ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය විසින් සත්කාරකත්වය දරන ලද ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ක්‍රීඩා (SLUG) සඳහා පවතින මණ්ඩපය ප්‍රතිසංස්කරණය කරන ලදී. එසේ නොවුවහොත්, තාවකාලික වේදිකා සහ අනෙකුත් සැකසුම් සකස් කිරීම සඳහා විශ්ව විද්‍යාලයට වැඩි මුදලක් වැය වීමට ඉඩ තිබුණි. | ජාතික අයවැය චක්‍රලේඛය දැඩි ලෙස පිළිපැදීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහය** | | | |
| (i) III පරිච්ඡේදයේ 20.8 සහ VI පරිච්ඡේදයේ 4.1 උප වගන්ති | උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකුගේ ඉල්ලා අස්වීම 2020 අගෝස්තු 29 වන දින කවුන්සිලය විසින් පිළිගෙන තිබුණි. පසුව 2020 සැප්තැම්බර් 3 වන දින සිට බලපැවැත්වෙන පරිදි කථිකාචාර්යවරයා පෙර තනතුරටම නැවත සේවයේ යොදවා තිබුණි. කෙසේ වෙතත්, ආයතන සංග්‍රහයට පටහැනිව, රු.91,310 ක ආරම්භක වැටුප වෙනුවට වැටුප් පියවර රු.119,520 හි පිහිටුවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2020 සැප්තැම්බර් 3 සිට 2024 පෙබරවාරි දක්වා කාලය තුළ කථිකාචාර්යවරයාට රු.3,633,900 ක් වැඩිපුර ගෙවා තිබුණි. | නීති කටයුතු කමිටුව ඇයගේ ඉල්ලීම නිර්දේශ නොකළ අතර, එහි නිර්දේශය කවුන්සිලය වෙත යොමු කර ඇත. කවුන්සිලයේ අවසන් තීරණය බලාපොරොත්තුවෙන් සිටී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) XX පරිච්ඡේදයේ 3.1 උප වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 10/2017. | අධ්‍යයන කාර්ය මණ්ඩල පැමිණීම තහවුරු කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ රු. 1,435,494,950 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | සාම්ප්‍රදායිකව, අනෙකුත් සියලුම විශ්ව විද්‍යාලවල සිදු කරන පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩලය ඇඟිලි සලකුණු යන්ත්‍රයේ ඔවුන්ගේ පැමිණීම සටහන් නොකරයි. | -එම- |
| **(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව** | | | |
| (i) 2018 ඔක්තෝබර් 12 දිනැති ලිපිය | වසර තුනකට අධික කාලයක් අයකර යුතුව තිබූ රු.2,305,000 ක මහපොළ භාර අරමුදල ප්‍රතිපූරණය කිරීමට පියවර ගෙන නොතිබුණි. | ශිෂ්‍යත්ව අරමුදල් ප්‍රතිපූරණය කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ විශ්වවිද්‍යාලය නිතිපතා සන්නිවේදනය සහ | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | | කඩිසර පසුවිපරමක් සිදු කරනු ලැබේ. | |
| (ii) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 10/2017 සහ නැගෙනහිර විශ්වවිද්‍යාල අභ්‍යන්තර චක්‍රලේඛ අංක EUSL/E/C/2007/06 | අධ්‍යයන නොවන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය විසින් ඇඟිලි සලකුණු ස්කෑනර් යන්ත්‍ර නිසි ලෙස භාවිතා කර නොතිබුණු බව නිරීක්ෂණය විය. 2024 ජනවාරි සිට ඔක්තෝබර් අතර කාලයේදී (වර්ජන කාලය හැර) දින 45 ක හිමිකම ඉක්මවා දින 106 ක් දක්වා නිවාඩු ලබා ගත් කාර්ය මණ්ඩලයේ 58 දෙනෙකු විගණනයේදී නිරීක්ෂණය විය. දුර්වල නිවාඩු පාලනයන් හේතුවෙන්, මෙම කාලය තුළ වැටුප් වශයෙන් ගෙවන ලද රු.99,181,457 ක මුදලේ නිරවද්‍යතාවය සත්‍යාපනය කළ නොහැකි වූ අතර, 2024 දෙසැම්බර් 31 වන විට නොගෙවූ නිවාඩු සඳහා අඩු කිරීම් සිදු කර නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 10/2017 සහ නැගෙනහිර විශ්වවිද්‍යාල අභ්‍යන්තර චක්‍රලේඛ අංක EUSL/E/C/2007/06 අනුව, සියලුම කාර්ය මණ්ඩලය පැමිණීම වාර්තා කිරීම සඳහා ඇඟිලි සලකුණු ස්කෑනර් භාවිතා කළ යුතුය. ත්‍රිකුණාමලය මණ්ඩපයේ, තාක්ෂණික ගැටළු, විදුලි බිඳවැටීම් සහ මානව දෝෂ හේතුවෙන් භාවිතය අස්ථාවර වී තිබුණි. | පැමිණීම සටහන් කර ගැනීම සඳහා ඇඟිලි සලකුණු ස්කෑනර් යන්ත්‍ර භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.136,416,567 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.379,540,072 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.515,956,639 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රු.318,800,000 ක පුනරාවර්තන ප්‍රදානවල වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 සහ 2019 දී AHEAD ව්‍යාපෘතිය යටතේ රු.81,977,656 ක ප්‍රදාන ලබා තිබූ අපේක්ෂකයින් නව දෙනෙකුට නියමිත කාලය තුළ ඔවුන්ගේ ආචාර්ය උපාධි වැඩසටහන් සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි. මෙම | සියලුම බැඳුම්කර මුදල් අයකර ගැනීමට පියවර ගනිමින් පවතී. | ව්‍යාපෘති නියමයන් සහ කොන්දේසි දැඩි ලෙස පිළිපැදීමට සහ ප්‍රදාන නිසි ලෙස භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අපේක්ෂකයින් නව දෙනාගෙන් අපේක්ෂකයින් පස් දෙනෙකුම විශ්ව විද්‍යාල සේවයෙන් පහ කර තිබුණු අතර, ආචාර්ය උපාධි වැඩසටහන සම්පූර්ණ නොකිරීම හේතුවෙන් රු.45,977,656 ක ප්‍රදාන ඵල රහිත වී තිබුණි. | | |
| (ආ) | ඉගෙනීම, ඉගැන්වීම, තක්සේරුව (ELTA) වැඩිදියුණු කිරීම සහ ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩිදියුණු කිරීමේ සංවර්ධන ව්‍යාපෘති (ELSE DPs) වැඩිදියුණු කිරීම යටතේ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා වන මාර්ගෝපදේශවලට අනුව, අවම වශයෙන් එක් ක්‍රියාකාරකමක් හෝ ඉංග්‍රීසි භාෂා සංරචකය විශේෂයෙන් ඉලක්ක කර ගත යුතුය. කෙසේ වෙතත්, 2022 දී, ත්‍රිකුණාමලය මණ්ඩපය මගින් ඉහත ව්‍යාපෘතිය යටතේ කිසිදු ඉංග්‍රීසි භාෂා ක්‍රියාකාරකමක් ක්‍රියාත්මක නොකර චිත්‍රපට ශාලාවක් ඉදිකිරීම සඳහා රු.18,568,775 ක් වැය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීමේ මූලික අරමුණ සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | 2022 ඔක්තෝබර් 13 වන දින පැවති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු **(DPC)** රැස්වීමේ අනුමැතියට අනුව, මූල්‍ය කමිටුවේ තීරණය මත පදනම්ව ත්‍රිකුණාමලය මණ්ඩපයේ චිත්‍රපට ශාලාව සඳහා භාණ්ඩ මිලදී ගැනීමේ ඇණවුමක් ලබා දෙන ලදී. | ව්‍යාපෘති නියමයන් සහ කොන්දේසි දැඩි ලෙස පිළිපැදීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ත්‍රිකුණාමල මණ්ඩපය 2024 අප්‍රේල් 12 සිට 2024 ජුනි 18 දක්වා දීපව්‍යාප්ත අනධ්‍යයන වැඩ වර්ජනයකට මුහුණ දී තිබුණි. කෙසේ වෙතත්, වැඩවර්ජන කාලය තුළ මණ්ඩපයේ පිරිසිදු කිරීම, සනීපාරක්ෂක සේවා හෝ උද්‍යාන නඩත්තු කටයුතු සිදු නොවූ දින සඳහාද කිසිදු අඩු කිරීමක් සිදු කිරීමකින් තොරව මිනිස්බල කොන්ත්‍රාත්කරුට රු. 5,296,708 ක මුළු මුදල් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. | 2024 මැයි 02 සිට 2024 ජූලි 15 දක්වා පැවති අනධ්‍යයන කාර්ය මණ්ඩල වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය අතරතුර, දේශන, ප්‍රායෝගික සහ විභාග වැනි අධ්‍යයන කටයුතු තාවකාලික, සහායක සහ බාහිරින් ලබාගත් කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව දිගටම සිදු විය. | ගිවිසුමේ නියමයන් සහ කොන්දේසි දැඩි ලෙස පිළිපැදීමට පියවර ගත යුතුය. |
| (ඈ) | 2024 දෙසැම්බර් 31 දිනට රු.437,077,616 ක මුළු ලැබිය යුතු ශේෂයෙන් රු.238,964,922 ක් (සියයට 52) වසර 03 සිට 40 දක්වා කාලයක් අයකර ගෙන නොතිබුණි. එයින්, බැඳුම්කර සහ ගිවිසුම් කඩ කළ කථිකාචාර්යවරුන් 66 දෙනෙකුගෙන් අයකරගත යුතු රු.147,164,353 ක බැඳුම්කර වටිනාකම වසර 10 සිට 40 දක්වා කාලයක් අයකර ගෙන නොතිබුණි. | ණය පැහැර හරින අයට සහ ඔවුන්ගේ ඇපකරුවන්ට වරින් වර ඉල්ලීම් ලිපි යවනු ලබන අතර මේ දක්වා බැඳුම්කර පැහැර හරින ලද අයගෙන් රුපියල් මිලියන 37 ක් පමණ අයකරගෙන ඇත. | බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට පියවර ගත යුතුය. |